01. "සේවක සංඛ්‍යාව 25ට අඩු ව්‍යාපාර කුඩා හා මාධ්‍ය පරිමාණ ව්‍යාපාර" ලෙස හඳුන්වා දී ඇත්තේ කුමන ආයතනය මගින් ද ?

1 ශ්‍රී ලංකා මහ බැංකුව 2 ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව

3 කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව

4 ප්‍රාදේශීය ලේකම් කාර්යාලය

02. රාජ්‍ය සංස්ථාවකට නිදසුනක් නොවන්නේ,

1 විදේශ සේවා නියුක්ති කාර්යාංශය

2 ජාතික තරුණ සේවා සභාව

3 වරාය අධිකාරිය

4 සණස ආයතනය

03. නිර්මාල් විසින් ආරම්භ කළ ව්‍යාපාරය "නිර්මාණි ව්‍යාපාරය" නමින් ලියාපදිංචි කරයි. මේ නිසා ඔහුට අත්වන වාසියකි.

1. ව්‍යාපාරයට අඛණ්ඩ පැවැත්මක් ලැබීම.
2. ව්‍යාපාරයට නීතිමය පුද්ගලභාවයක් ලැබීම.
3. ව්‍යාපාරයට අනන්‍යතාවයක් ලැබීම.
4. ව්‍යාපාරයේ වගකීම සීමාසහිත වීම.

04. නාලක රත්නසේකර වෘත්තියෙන් නීතිඥවරයෙකි. ඔහු තම නීතිඥ මිතුරන් කීපදෙනෙකු එක් රැස් කර ගෙන නීති උපදෙස් සැපයීමේ ආයතනයක් ආරම්භ කිරීමට සැලසුම් කරයි. මෙම ව්‍යාපාරයට බඳවා ගත හැකි උපරිම සාමාජිකයන් සංඛ්‍යාව වන්නේ,

1 දෙකකි. 2 දහයකි. 3 විස්සකි. 4 සීමාවක් නැත.

05. ශ්‍රී ලංකා වරාය අධිකාරිය, විදේශ සේවා නියුක්ති කාර්යාංශය, කෘෂි රක්ෂණ මණ්ඩලය යන ව්‍යාපාර අයත් වන්නේ,

1 රාජ්‍ය දෙපාර්තමේන්තුවලටය. 2 රාජ්‍ය සංස්ථාවලටය.

3 රාජ්‍ය සමාගම්වලටය. 4 සංස්ථාපිත සමාගම්ය.

06. නීතිමය කටයුතුවලදී ආයතන ප්‍රධානියා සිය නිළ නාමයෙන් පෙනී සිටිය යුතු වන්නේ,

1 රාජ්‍ය සංස්ථාවලය. 2 රාජ්‍ය සමාගම්වලය.

3 රාජ්‍ය සංස්ථාපිත සමාගම්වලය. 4 රාජ්‍ය දෙපාර්තමේන්තුවලය.

07. තනි පුද්ගල ව්‍යාපාර හා හවුල් ව්‍යාපාර යන සංවිධාන වර්ග දෙකටම පොදු ලක්ෂණයකි.

1 වගකීම අසීමිත වීම. 2 නෛතික පුද්ගලභාවයක් පැවතීම.

3 ලියාපදිංචිය අනිවාර්ය වීම. 4 අඛණ්ඩ පැවැත්මක් තිබීම.

08. පරිමාණය අනුව ව්‍යාපාර වර්ගීකරණය සඳහා යොදා ගනු ලබන ප්‍රමාණාත්මක නිර්ණායකයක් නොවන්නේ,

1 ව්‍යාපාරයේ ප්‍රාග්ධන ප්‍රමාණය 2 සේවක සංඛ්‍යාව

3 ව්‍යාපාරයට ඇති වෙළෙඳපොල කොටස

4 නෛතික පුද්ගලභාවය